# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

| 21 | S | I, II, III |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III** **කාලය පැය තුනයි.**

**නම / අංකය : ....................................................................** **11 ශ්‍රේණිය**

සැලකිය යුතුයි,

- සියලුම ප්‍රශ්න වලට පිළිතුර සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තොරන්න. (විභාගයේදී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)
- අංක 1- 4 තෙක් ප්‍රශ්න වල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. අධ්‍යක්ෂවරයා ගත් තීරණ හමස් පෙට්ටියට යෑම පිළිබඳව සේවකයෝ පුදුමයට පත් වෙති.
   i. ඉටුවී තිබීම  ii. නිශ්ඵල දෙයක් වීම
   iii. ක්‍රියාත්මක වී නොතිබීම  iv. වාර්තාවට ඇතුළු වී තිබීම

2. අධ්‍යාපනයේ කටුකොහොල් හැරවීම ගැන එතුමා සිය කථාවේදී දැඩිව අවධාරණය කළේය
   i. කැලෑ එළිකිරීම  ii. පනත් සම්මත කිරීම  iii. එරෙහි වීම  iv. බාධක ඉවත් කිරීම

3. කොලේ වහලා ගැහීමෙන් ප්‍රශ්නය අවුල්වන බව විදුහල්පතිතුමා පැහැදිලි කළේය
   i. යමක් සැඟවීමෙන්  ii. කාඩ් සෙල්ලම් කිරීමෙන්
   iii. සෙවිය නොහැකි  iv.වීමෙන්මුදල් වංචා පකිරීමෙන්

4. මැදපෙරදිග ගොස් පැමිණි ඔහුගේ පම්පෝරිය ඇසීමට කිසිවෙක් කැමති නොවූහ
   i. උගත් වචන  ii. බොරු පුරසාරම් කීම  iii. ධනවත් කම  iv. සියලු විස්තර

- අංක 5 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු පදය යොදන්න

5. තමා අසා ඇති කියවා වි ඇති දේ ඇසුරෙන් ............................ මගින් ගොඩනැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගත වෙයි.
   i. ධ්වනිපූර්ණ  ii. වාච්‍යාර්ථය  iii. අවස්ථෝචිත  iv. පරිකල්පනය

6. ගොවිතැන සමග ...................... ම බැඳුනු අනෙක් මහාර්ඝ නිර්මාණය වැව ය.
   i. ශිෂ්ටාචාරයේ  ii. සහයෝගීතාව  iii. අත්‍යන්තයෙන්  iv. බීජරෝපනය

7. වචන දහස් ගණනකින් කිව යුතු දෙයක් එක් ප්‍රබල .............................. කිව හැකිය
   i. නාදයකින්  ii. ආතතියකින්  iii. විරාමයකින්  iv. සංකේතයකින්

8. ග්‍රාමීය ප්‍රදේශයන්හි දක්ෂ දරුවන්ට සමාජයේ ඉහළ ස්ථරවලට ............................ වීමේ හිණි මග මධ්‍ය මහා විද්‍යාල විය
   i. වසන්  ii. සම්ප්‍රාප්ත  iii. ප්‍රතිපත්ති  iv. විවේචනය

9. ඒ භාෂාව කථා කිරීමට ඉමිහිරිය, රසවත් ඇමතුමෙන් හා .................... භාවයෙන් පරිපූර්ණය
   i. වාග් ශක්තියෙන්  ii. අභිමානයෙන්  iii. ප්‍රතිභාවයෙන්  iv. ජනකාන්ත

10. සංචාරක ජීවිතයෙන් මිදී එක් තැනක දීර්ඝ කාලයක් ජීවත්වීමේ පුරුද්දට නැඹුරුවූහ. ඒය හඳුන්වන්නේ .................... යනුවෙනි
   i. ස්ථිරවාසීතාව  ii. ලියාපදිංචිය  iii. ස්ථාවරභාවය  iv. වළවාසස්ථාන

- 11-15 තෙක් වාක්‍යවල දක්නට ලැබෙන වරද කුමක්ද යන්න ඉදිරිපත් කොට ඇති ප්‍රකාශ අතරෙන් තෝරන්න

11. ඉක්මනින් විසඳිය යුත්තේ කතාකරන භාෂාවෙන් පොත් ලිවිය යුතුය
   i. ලිවිය යුතුද යන්න නොයොදා ලිවිය යුතුය යැයි යෙදීම
   ii. ලියනු යුතු යැයි නොයොදා කාකරන භාෂාවෙන් යැයි යෙදීම
   iii. ලේඛන රීතියෙන් යැයි නොයොදා ලිවිය යුතුයැයි යෙදීම
   iv. අනුක්‍රමයෙන් යැයි නොයොදා ඉක්මනින් යැයි යෙදීම

12. සුදත්තගේ උපදෙස් සාමාජිකයන් නොමග යවන සුලුය
   i. සාමාජිකයෝ යැයි විය යුතු තැන සාමාජිකයන් යැයි යෙදීම
   ii. සුදන්ත දුන් උපදෙස් යන්න වෙනුවට සුදන්තගේ උපදෙස් යැයි යෙදීම
   iii. නොමගට යන්න නොයොදා නොමග යයි යෙදීම
   iv. යවනසුලු යන්න වෙනුවට යන සුලු යැයි යෙදීම

13. යෝජනාවෙන් කියවෙන්නේ රට රැකීමට එකාමෙන් නැගී සිටිය යුතුය
   i. සිටිය යුතුම යයි අවධාරණය නොකොට තිබීම
   ii. යෝජනාවෙන් ඉදිරිපත් වෙන්නේ යයි නොකියා කියවෙන්නේ යයි යෙදීම
   iii. සිටිනු යුතුය යැයි යෙදීම වෙනුවට සිටිය යුතු යැයි යෙදීම
   iv. නැගී සිටිය යුතු බවය යන යෙදුම වෙනුවට නැගී සිටිය යුතුය යැයි යෙදීම

14. මාමා දැන් රක්ෂාව කරන්නේ රථවාහන මිලයට ගැනීම හා විකුණන ස්ථානයකය
   i. විකිණීම කරන යැයි නොයොදා විකුණන යැයි යෙදීම
   ii. මිලයට ගෙන යන්න වෙනුවට මිලයට ගැනීම යයි යෙදීම
   iii. දැනට රක්ෂාව කරනුයේ යැයි නොයොදා දැන් රක්ෂාව කරන්නේ යැයි යෙදීම
   iv. වෙළඳාම් කරන යන්න වෙනුවට විකුණන යැයි යෙදීම

15. මට කියන්නට ඇත්තේ සියලු දෙනාම එකාමෙන් සමගියෙන් නැගී සිටීමට අධිෂ්ඨාන කරගෙන සිටීමයි
   i. කියන්නට ඇත්තේ යැයි අනවශය කොටසක් යෙදීම
   ii. නැගී සිටීම වෙනුවට සිටීමයි යන්න යෙදීම
   iii. සිටින බවය යැයි නොයොදා සිටීමයි යන්න යෙදීම
   iv. එකාමෙන් යැයි කියා සමගියෙන් යැයි නැවතත් කීම

16. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න
   i. ෙඑරාවන, එළිපෙහෙලි, අභ්‍යවකාස, උසුළු විසුළු
   ii. සෙවනැල්ල, විශ්ලේෂණ, විශේෂණ, විමර්ශණ
   iii. ලෞකික, යථාවබෝධ, ප්‍රස්ථාව පිරුළු, ප්‍රතිෂ්ඨාපන
   iv. නිලධාරී, නිෂ්ප්‍රයෝජන, ජ්‍යොතිෂ, කාලච්ඡේදය

17. මුලින් දැක්වෙන පදයට සාමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න
   i. උපදේශය - අවවාදය, අනුශාසනය, දැනමුතුකම, ඔවදන
   ii. කනගාටුව - තැවුල, සන්තාපය, ඛේදය, උදහස
   iii. කෙට්ටු - කෘෂ, කැහැටු, කේඩෑරි, වැහැරුණු
   iv. උගත් - විද්වත්, වියත්, පැණසර, විග්ධ

18. විරුද්ධාර්ථවත් පද යුගලය සහිත වරණය තෝරන්න

i. මෘදු - සිනිඳු ii. තිමිර - අඳුර iii. පටුත්වය - කෝඩු iv. නිර්ණය - නිගමනය

19. "හිරු උදාවත නෙළුම් මල් පිපෙයි" යන වාක්‍යයේ උදාවත යන්න,

i. පූර්ව ක්‍රියා පදයකි ii. අසම්භාව්‍ය ක්‍රියා පදයකි
iii. මිශ්‍ර ක්‍රියා පදයකි iv. අතීත කාල ක්‍රියා පදයකි

20 සහ 21 ප්‍රශ්න වල වැරදි අදහස සහිත වාක්‍ය තෝරන්න

20. i. දර්පය යන්න අහංකාර යන්නට පර්යාය පදයකි
ii. දරුවා ඇතුකෙරේ භයින් මහඩින් හැඩීය. ඉරි ඇඳි පදය ක්‍රියා විශේෂණයකි
iii. "දුමන" යන පදයේ දු යනු උපසර්ගයකි
iv. දක්ෂ කතුවයෙකු වන්නේ කෙසේද? යන වාක්‍ය ව්‍යාකරණානුකූලව නිවැරදිය

21. i. "තෙමේ" යන්න පුරුෂ ලිංග ඒකවචන ද "තොමෝ" යන්න ස්ත්‍රී ලිංග ඒකවචන ද වේ
ii. "කෝ" "කොයි" "කවරහුද" ආදී පද යොදා ප්‍රශ්න ඇසීමේදී උක්තය උක්ත ස්වරූපයෙන්ම සිටී
iii. "සමග" "කැටුව" යන නිපාත එක්ව යන අර්ථය ගනී. එවිට ඒ සමග ඇති නාමපදය අනුක්ත වේ
iv. ව්‍යංජනයකය පරව බැඳෙන "ර්" වෙනුවට රේඵයත් ව්‍යංජනයකට පරව බැඳෙන "ය" වෙනුවට රකාරාංශයත් යො දනු ලැබේ.

22. දී ඇති වචන ගොනු අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් ලංවන කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය වන්නේ,
i. කොහොඹ, හල්මිල්ල, බුරුත, වීර
ii. සරම, බැනියම, කමිසය, අමුඩය
iii. කඩුව, පොල්ල, දුන්න, බොලොක්කය
iv. මාල, වළලු, මුදු, තෝඩු

23. අර්ධ ස්වර පමණක් ඇතුළත් වාක්‍ය තෝරන්න

i. ය ර ල ව ii. ය ම ම බ ව iii. ග ඩ ද ඹ iv. ශ ෂ ස හ

24. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න

i. ක්‍රියාපද - නිරෝගිවෙත්වා, එනු, එමින්, කරන ii. නිපාත - පතා, එපා, මුත්, අනු
iii. තද්ධිත - ළැදියා, පාපීය, ජාතික, මූලික iv. කෘදන්ත - බලන, කියූ, නැටිලි, ගැයුමන්

- අංක 25-26 ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න

25. නිසි ඵල ලබාගත නොහැකිවීම

i. ගඟෙන් දිය බී මුහුදට ආ වඩන්නා සේ ii. දත් නැතිදා උක්දඬු ගිනි තපින්නද?
iii. බත් ඇති දා කොස් තිත්තලු iv. ගැරඩින් පෙනේ කරන්නට හදනවා වගේ

26. වැරදි කරුවාගෙන්ම පිහිට පැතීම

i. හොරාගෙ අම්මාගෙන් පේන ඇහුවා වගේ ii. බල්ලාගේ වැඩේ බූරුවා කෙරුවා වගේ
iii. නයි පොළොං දබරය වගේ iv. කපන්ට බැරි අත ඉඹින්නා වගේ

27. පහත දී ඇති අක්ෂර ගැලපීමෙන් සූචනය වන නිවැරදි පුද්ගල නාමය ඇතුළත් වරණය වන්නේ,

i. බු දු හු අ සෙ න් සෙ රි අ ii. ර නෝ ම ත් ජ ම ය න ත් ල
iii. ම ල වි කු ර මා ත් න ර ම ග iv. ක න යා ජී සේ බි නා ක ය

28. ශිෂ්‍යාව යන පදයේ අනියමාර්ථ ඒකවචන අනුක්තපදය සහිත වරණය තෝරන්න
   i. ශිෂ්‍යාවන්   ii. ශිෂ්‍යාවක්
   iii. ශිෂ්‍යාවක   iv. ශිෂ්‍යාවෝ

29. ගයන්න, නටනවා, දුවයි, බලති යන ක්‍රියාපදවල ධාතු ප්‍රකෘති පිළිවෙලින්
   i. ගය, නට, දුව, බල   ii. ගසා, නටා, දුවා, බලා
   iii. ගයයි, නටයි, දුවයි, බලයි   iv. ගැයූ, නැටූ, දිවූ, බැලූ

30. වඟ + මුතු එයින් + ඇත ෙද + තඹ + පලා යන පද නිවැරදි ලෙස සන්ධි කර ඇති පද පේළිය තෝරන්න
   i. වංමුතු එයිනැත දැත තම්විලා   ii. වගමුතු එයින්ඇත දෙඅත තම්බවිලා
   iii. වංමුතු එයනැත අත්දෙක තඹපලා   iv. වගතු එයින්එහා දැත තඹරලා

- අංක 31-35 දක්වා දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න

31. i. දෙරටේම නියෝජිතයෝ ඇමතිවරු ඉදිරියේ ගිවිසුමට අත්සන් තැබූහ
   ii. පළාත් සභාවේ සභිකයන් විසින් ඇමතිතුමා පිළිගැනිණි
   iii. ක්‍රීඩකයෝ පුහුණු කරනු ලැබුවේ උපදේශකවරුය
   iv. සමහරු පොත්පත් කියවීමෙන්ම දැනුම දියුණුකරගනී

32. i. උද්්‍යෝගයෙන් හා පරිත්‍යාගයෙන් ක්‍රියාකළ අපේ ජාතික වීරයන් සියලු බාධා ජයගත්හ
   ii. අපරාධ මැඩලීම සඳහා පොලිස් නිලධාරීහු මහජන සහායද ලබාගත යුතුය
   iii. මා ඉදිරි දිනක ගමට එතියි සිතමින් පියාණෝ කල් ගෙවති
   iv. අපකිසිවෙකුට බිය නොවේයැයි කීමෙන් හෙළිවන්නේ අපතුළ ඇති බියමය

33. i. කලාකාමී තරුණයා විසින් රඟහල ඉදිකරන්නේ විශාල ධනයක් වැයකරමිනි
   ii. අළුතින් පත්වී ආ ලේකම්තුමා දක්ෂයෙක්ද?
   iii. අද රැස්වීමට සේවක සේවිකාවෝ පැමිණ නැත
   iv. මේ දේශනය පවත්වමියි ඒදා මම පොරොන්දු වූ බැවින් අද පැමිණියෙමි

34. i. මෙරට පැමිණි ඉංග්‍රීසිහු මුලදී පාලනය කළේ මුහුදුබඩ ප්‍රදේශ පමණි
   ii. අශෝක චක්‍රවර්තීහු පිටරටවලටද ධර්ම දූතයෝ යැවූහ
   iii. සේවකයන් නියමිත කාලයතුළ වැඩ කොටස නිම නොකරතියි සිතූ ස්වාමියා අතිකාල ක්‍රමයක් යෝජනා කළේය
   iv. මැණියන් විසින් අපි නිරතුරුවම රක්ෂා කරන්නීය

35. i. සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගතකරනු ලැබූහ
   ii. ළමයා නිසි ඉගෙනීමේ යෙදේ නම් ඔහු උගතකු වනු නිසැකය
   iii. විදුහල්පතිතුමා සභාව අමතා සාරවත් කථාවක් පැවැත්වූහ
   iv. විවිධ ප්‍රසංගයේ අමුත්තෙක් ලෙස මා ද ඇරයුම් ලද නමුත් මම එහි නොගියෙමි

36. "ඉතා ඉක්මනින් විසඳිය යුත්තේ කතාකරන භාෂාවෙන් ලිවිය යුතුය"
   i. ලිවිය යුතු නොවේ යන්න ලිවිය යුතු යැයි දැන්වීම
   ii. ලිවිය යුතුද යන්න වෙනුවට ලිවිය යුතු යැයි ඉදිරිපත් කිරීම
   iii. ලියන භාෂාවෙන් යැයි නොලියා කතා කරන භාෂාවෙන් යයි යෙදීම
   iv. ක්‍රමානුකූලව යන්න වෙනුවට ඉතා ඉක්මනින් යැයි යෙදීම

37. සභාපතිතුමාගේ කතාව සාමාජිකයින් නොමග යන සුලුය
   i. සභාපතිතුමාගේ කතාව යන්න වෙනුවට සභාපතිතුමා පැවැත්වූ කථාව යැයි නොයෙදීම
   ii. සාමාජිකයෝ යන්න නොයොදා සාමාජිකයන් යැයි යෙදීම
   iii. යවනසුලු යන්න වෙනුවට යනසුලු යැයි යෙදීම
   iv. නොමග යන්න වෙනුවට නොමගට යැයි නොයෙදීම

- අංක 38-40 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රකාශයට වඩාත් සමීප අර්ථය ලබාදී ඇති වරණය තෝරන්න

38. සාහිත්‍ය කෘතියේ අන්තර්ගතය නිර්මානකරුවා ගේ අත්දැකීම් මත පදනම් වෙයි. ඔහු අසා දැක තිබෙන විඳ ඇති දේ ඇසුරෙන් පරිකල්පනය මගින් ගොඩනැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගත වෙයි.
    i. සාහිත්‍යකරුවාගේ පරිකල්පනයටත් අන්තර්ගතයටත් හේතුවන්නේ යතාර්ථය නිසා ඇතිවූ අත්දැකීම් සම්භාරයයි
    ii. නිර්මාණකරුවාගේ අත්දැකීම් ඇසුරෙන් පරිකල්පනයෙන් මතු කරගත් යථාර්ථය නිර්මාණයේ අන්තර්ගතය වෙයි
    iii. බිහිවන යථාර්ථය සාහිත්‍ය කරුවාගේ අත්දැකීම් මත අනුව පරිකල්පනය කෙරේ
    iv. සාහිත්‍ය කෘතියේ අන්තර්ගය අත්දැකීම් මත පිහිටා පරිකල්පනය කිරීමේ අන්තර්ගතය අත්දැකීමකි

39. රචනා රීතිය යනු භාෂා සාහිත්‍යයේදී විශිෂ්ඨ ලෙස කෙරෙන පද ගැලපීමයි. එය ලේඛකයාගේ වචන තෝරාගැනීම හා වචන ගැලපීමත් කථන ක්‍රමයත් යන දෙකෙහිම සංකලනයෙන් සකස්වන ප්‍රකාශන උපක්‍රමයකි
    i. ආකාර දෙකක වචන සංකලනයේ ප්‍රකාශන උපක්‍රමය රචනා රීතියයි
    ii. භාෂා භාවිතයේදී මනා ලෙස වචන සැකසුමෙන් ගැලපීම යනු රචනා රීතියයි
    iii. ලේඛකයෙකුගේ වචන සැකසුම හා කථන ක්‍රමයේ ගැලපීමෙන් විස්තර කෙරෙන ප්‍රකාශන උපක්‍රමය රචනා රීතියයි
    iv. විශිෂ්ට පද ගැලපීමත් ලේඛකයාගේ ප්‍රකාශන උපක්‍රමයත් වන්නේ රචනා රීතියයි

40. භාෂාවේ භාවිත ගුණය යනුවෙන් අදහස් වන්නේ,
    i. ව්‍යංගාර්ථවලින් පරිපෝෂිත වාං මාලාවක් යොදා ගැනීමේ හැකියාව
    ii. සිතේ ඇතිවන ප්‍රහර්ෂය වර්ණනා කිරීමේ හැකියාව
    iii. සමාස පද බහුලව භාවිත කොට නිර්මාණය රසවත් කිරීමේ හැකියාව
    iv. භාවයන් ප්‍රබෝධවත් කොට අත්දැකීමට සහභාගී කරවා ගැනීමේ හැකියාව

## සිංහල භාෂාව හා සාහිත්‍ය II

සැ.යු. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
කාලය පැය 02
II පත්‍රය

1. (1) සිට ( X ) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංක ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) සිංහල අක්ෂර මාලාවේ තාලුජ අක්ෂර දෙකක් ද උෂ්මාක්ෂර දෙකක්ද ලියා දක්වන්න

(අ) .................................................... (ආ) ......................................................

II. ඩ හා ඛ යන අක්ෂර වලින් ඊන වචන දෙක බැගින් ලියන්න

(අ) .................................................... (ආ) ......................................................

III. පහත සඳහන් පද දෙක විසන්ධි කොට ලියන්න

(අ) පන්ලක්ෂ - .......................................... දූරාචාර - ...................................................

(ආ) පිළිතුරු , දැඟුල් යන පදවල සන්ධි නාමය ලියන්න

IV. (අ) ගොයම්මිටි ගොඩ ගැසූවිට හඳුන්වන නම ලියන්න

...........................................................................

(ආ) උණ පුරුක් ප්‍රයෝජනයට ගෙන වක්කඩ අසල අටවන්නේ කුමක්ද?

.....................................................

V. "මූණ රවාගෙන ගොස් ගෙට වැදිලා
පූන නූල ඇද දමමින් බිඳලා"

(අ) ඉහත කවි දෙපදයෙන් පූර්ව ක්‍රියා පදයක් ලියන්න

..............................................................................................................

(ආ) මිශ්‍ර ක්‍රියා පදයක් ලියන්න

..............................................................................................................

VI. (අ) හේන ගිනි ලැමෙන් පසු ප්‍රථම වර්ෂාව හඳුන්වන නම ලියන්න

...............................................................................................

(ආ) ගොවීන් "මහජ්කා" යනුවෙන් හඳුන්වන්නේ කවුද?

...............................................................................................

VII. පහත දැක්වෙන ක්‍රියා පදවල ප්‍රකෘති වෙන්කොට දක්වන්න

(අ) රකිනවා - ....................................................... (ආ) බොනවා - .................................................

VIII. "නුඹ සා මඩුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සඳ මල් කැනක සිරි ගත"

ඉහත කවි පදවල ***සඳ සඳ*** අර්ථ වෙන් වෙන්ව ලියන්න.

(අ) සඳ - ......................................................... (ආ) සඳ - .......................................................

IX. (අ) ශබ්ද කෝෂයේ "කලකල" යනුවෙන් දක්වා ඇත්තේ කුමක්ද?

(ආ) ප්‍රේක්ෂකයාගේ සිතේ කුතුහලය හා ආතතිය උපරිම ලෙස කුළුගැන්විය හැකි අවස්ථා හඳුන්වන නම ලියන්න

X. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"සිය බිළිඳු දරුවා වඩාගත් ගැහැණිය මාලිගාව අසල වැලපෙන්නට වූවාය"

2. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වඩන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තරපත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළගැස්වීමේදී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදාගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මගපෙන්වීමක් අදාල විස්තර ඇසුරෙන් ලබා ගන්න.

(අ) වර්තමානය වන විට සමස්ත ලෝකයේ ම පාරිසරික වෙනස්කම් රැසක් සිදුවෙමින් පවතී. එක් රටක අධික සීතලෙන් මිය යන අතර තවත් රටක දැඩි නියඟයෙන් පීඩා විඳී. විවිධ රටවල ජනතාවට ජලය සොයා බොහෝ දුර යාමට සිදුවී ඇත්තේ ජල සම්පත සීමිත නිසාය. කෙසේ වෙතත් මේ වන විට ගෝලීය උණුසුම වැඩි වෙමින් පවතී. විශේෂයෙන් දුප්පත් රටවල ජනතාවට සිදුව ඇති පීඩනය අති මහත්ය. මේ තත්වය එක් රටකට පමණක් විසඳිය හැකි දෙයක් නොවේ.

(ආ) සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ විදේශ විනිමය හිඟයයි. මේ නිසාම බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් විදේශ විනිමය උපයා ගැනීමට දැඩි පරිශ්‍රමයක් ගනී. මේ නිසාම රටවල් සංචාරක ව්‍යාපාරය කෙරේ දැඩි උනන්දුවක් දක්වයි. මේ රටවල ඓතිහාසික නගර, වනෝද්‍යාන, හිතකර වෙරළ පරිසරය ආදිය නැරඹීමට සංචාරකයෝ එති. සංචාරකයන් නිසා සිදුවන අහිතකර ලක්ෂණ ඉවත්කොට මෙම කර්මාන්තය දියුණු කොට අපරට සංවර්ධනයට දායක කිරීම කළ යුතුව ඇත.

(ඉ) ශ්‍රී ලංකාවේ ජාතීහු කිහිපයක් වෙසෙති. ඔවුන්ගේ සංස්කෘතිකාංග විවිධ වේ. එම විවිධත්වය නිසාම රටකට ඇති වන්නේ විවිධ ගැටළු සහගත තත්ත්වයන්ය. ආගම, භාෂාව, ඉඩම් පරිහරණය ආදී තත්වයන් උග්‍ර අතට හැරෙමින් පවතී. මේ නිසාම විවිධත්වය තුළ ඒකීය භාවය රටකට අවශ්‍ය වේ. එසේ නොවුනහොත් නුදුරු අනාගතයේදී ම නැවත මේ රට යුධ පිටියක් වනු නොඅනුමානයි.

(ඊ) ඉබෝලා, සාර්ස්, ඉන්ප්ලුවෙන්සා රෝග අතරට අළුතින්ම ආගමනය වී විශ්වීය බලපෑමක් කර සෙසු රෝග වලින් සිදුවන මරණ සංඛ්‍යාව දෙගුණ තෙගුණ කිරීමට සමත් වෛරස් රෝගයකි කොරෝනා. මේ තත්වය ඉතා කෙටි කලකින් නිර්මාණය වූවක් නොවේ. අත්තනෝමතික හා සාහසික ලෙස පරිසරයට කරන හානිය මෙහි ව්‍යාප්තියට බලපා ඇති එක් විශේෂ හේතුවකි. පරිසර හානිය තුළිනන් මෙහි වේගවත් ව්‍යාප්තිය මිනිසා කටයුතු කර ඇත. බටහිර රටවල ශීඝ්‍ර දියුණුව තුළින් වත් මේ සඳහා ක්ෂණික ප්‍රතිකාර සොයා ගැනීම අසීරු වී ඇත. ශ්වසන පද්ධතිය අකර්මන්‍ය කරන මෙම වෛරසය මාරාන්තිකය. පරිසරය පිරිසිදු හා හිතකර නම් මෙය ව්‍යාප්තිය හීන වේ. පරිසර සංරක්ෂණය යථාර්ථයක් කළ යුතුව ඇත. ස්වභාවධර්මය අසිරිමත්ය.

3. පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාවද සාරාංශය අග ලියන්න.

සෑම පුද්ගලයෙකු තුළ ම කලා නිර්මාණයකින් නිරූපිත ජීවන තතු සමාජ තතු දැකිය හැකිය. අවබෝධ කරගත හැකිය. එහෙත් එහි නිර්මාපකයා දැකිය නොහැකිය. නිර්මාණයේ පසුබිම දැකිය නොහැකිය. මේ අදහස් සාමාන්‍යයෙන් පිළිගන්නා නමුදු ඒවා ඒතරම් ම නිරවද්‍ය නොවේ. නිර්මාණයන්ගේ නිර්මාපකයා දැකිය හැකිය. එහි අර්ථය ඒ පුද්ගලයාගේ ස්වභාවය දැකීම නොවේ. ඇතැම් විට කෘතියකට වඩාත් සමීප වූ විට කෘතියේ නිර්මාපකයාගේ හැඩරුව, රුව ගුණ පවා දැකීමට පුළුවන. මේ අර්ථ සම්පන්න ක්‍රියාවක් ලෙස කෙනෙකුට පෙනෙනු ඇත. සැබැවින්ම මෙය භාවාත්මක ක්‍රියාවක් විය හැකිය. තතු එසේ වුවත් ඉන් අනාවරණය වන එක් වැදගත් දෙයක් ඇත. එනම් නිර්මාණය මෙන්ම නිර්මාපකයා පාඨකයාගේ ජීවිතයට කොතරම් දැඩිව සම්බන්ධ වන්නේ ද යන්නයි. ඒ දැඩි සම්බන්ධය නිසා පාඨකයා පරිකල්පනයෙන් බොහෝ දේ දකී.

4. සුප්‍රසිද්ධ වෛද්‍යවරයෙකුගේ අවමගුල් අවස්ථාවක් ගැන විස්තර කෙරෙන මේ පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

ඔබට කීම් එනමුත් නන් දෙසින් අවුත්
ලොකු කුඩා හිතවත් දන නෑ නොනෑ
උනට දුන් පණ හා ඔබ සුන් පණත්
සිහි කළෝ මුහුණේ අඳුරින් මහත්

ගමන දැක්ම වූවොත් වෙනදා ඔබේ
පිපෙන මූණු දනන් හැම මාවතේ
අඳුරු වී හැකිළී ගිය සේ බලත්
වෙනස මේ ගමනේ දැනුණේ තදින්

බැසමු වැන්දෙමු ගත්තෙමු පන්සිලුත්
පිරිකරත් ඇරදුන්නෙමු ලත් සෙයින්
මහණ මූණ නොවී මඳකුත් පහන්
වරදකින්ද පියාණෙනී ඒ ඔබේ

1. උනට දුන් පණ හා ඔබ සුන් පණ යන යෙදුමෙන් වෛද්‍යවරයා ගැන හෙළිවන තොරතුරු දෙකක් ලියන්න.
2. මෙතුමාගේ එදා ගමනත් අද ගමනත් දුටු ජනයා තුළ වූ හැඟීම් වෙන් වෙන්ව ලියන්න.
3. "බැසමු වැන්දෙමු" යන ප්‍රකාශයෙන් ඉදිරිපත් වන ඉරියව්ව සඳහා වරතමානයේ ව්‍යවහාර කරන යෙදුම කුමක්ද?
4. "පිරිකරත් ඇර දුන්නෙමු ලත් සෙයින්" යන්නෙන් පවුලේ අය ගැන කවර තොරතුරක් හෙළි වේද?
5. "මහණ මුහුණු නොවී මඳකුත් පහන්" මේ කොටසින් ඉදිරිපත් වන අර්ථය තනි වාක්‍යයකින් ලියන්න.

5. ලේඛකයෙකුගේ ගුණ සමරු උත්සවයකට සහභාගී වූ පුවත්පත් වාර්තාකරුවෙකුගේ දළ සටහනක් පහත දැක්වේ. එය ඇසුරින් පුවත් පතක් සඳහා වචන 100 ක පමණ වාර්තාවක් ලියන්න.

මාර්ටින් වික්‍රමසිංහ ගුණසමරුව
කුරුණෑගල නගර ශාලාව
2019.11.30 ප.ව. 2.00 – 6.00
මූලාසනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
ප්‍රධාන දේශනය ගුණදාස අමරසේකර මහතා
මාර්ටින් වික්‍රමසිංහ මහතා නවකථා කෙටිකථා
රචකයෙකු වශයෙන්, ඔහුගේ කෘති දෙකක් ගැන සාකච්ඡාව
සහභාගීත්වය - ගිහි පැවිදි කිහිපදෙනක් පාසල් සිසුන්
මෙයට සමගාමීව මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ ඡයාරූප හා
පොත් ප්‍රදර්ශනයක් නගර ශාලා භූමියේ පැවැත්වුනි.
සංවිධානය ඇතුගල්පුර සාහිත්‍ය සමාජය

නැතහොත්

තරබාරුකම අද වන විට පාසල් දරුවන් අතර බෙහෙවින් දක්නට ලැබෙන ගැටළුවකි. මේ නිසාම සිදුවන වෙනත් ආන්තරා ද තිබේ. මේ පිළිබඳව පාසල් දරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් විද්‍යාලයීය සෞඛ්‍යය සංගමය මගින් සංවිධානය කොට තිබේ. ඒ සඳහා පහත කරුණු උපයෝගී කරගෙන සුදුසු දැන්වීම ක් සකස් කරන්න.

දිනය - 2020.04.05 පෙ.ව. 8.30 – 11.30
ස්ථානය - විද්‍යාලයීය කන්නන්ගර ශාලාව
දේශනය - වි.වෛද්‍ය මානෙල් ගීකියනගේ, වෛද්‍ය සිරිල් මීගස්තැන්න
සහභාගීත්වය - 9 ශ්‍රේණිය - 13 ශ්‍රේණිය දරුවන්

කාලය ලපැය 02 යි

**III පත්‍රය**

- **උපදෙස් දී ඇත පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**

1. (1) සිට (x) තෙක් අති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. "උපාය නම් තමා කිම්ද? මේසා මහත්වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවෙකුත් දුටු දැ නැති"
(අ) මෙසේ කීවේ කාටද?
(ආ) මෙසේ කීමට හේතුව කුමක්ද?

II. ..............................................................................................................
..............................................................................................................
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නොවද කෙලෙසක සිත කාගේ

(අ) මෙම කවියේ මුල් පද දෙක ලියන්න.
(ආ) "කුසුම සරාගේ පැලද සරාගේ යන්නෙහි තේරුම ලියන්න.

III. "වහන්සේ හෙ මට මුසාවෙයි. මා විසින් බොහෝ සන්හු දනැ මරන ලදහ"
(අ) "හෙමට" යනුවෙන් මෙහි හඳුන්වන්නේ කුමක්ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් පොත අයත් සාහිත්‍ය යුගය ලියන්න

IV. "ඔබ දෙදෙන මා සමග
නොආවොත් යන්ට වේ"
(අ) මෙසේ යාමට අදහස් කරන්නේ කොතැනටද?
(ආ) මේ ප්‍රකාශය එන ග්‍රන්ථයේ කතුවරයා ලියන ලද ස්වයං ලිඛිත චරිතාපදානය ලියන්න

V. "ඔව්. එයත් මෙහෙ හිටියා උඹ ලඟ සල්ලිහෙම තියෙනවද?"
(අ) මෙහි "එයා" "උඹ" යනුවෙන් හඳුන්වන දෙදෙනාගේ නම් ලියන්න.
(ආ) මේ ප්‍රකාශය කරන අයගේ නම ලියන්න.

VI. "කඳු බෑවුමක දං - බෝවිටි පඳුරු තලා
පහලට ඇදී පරමල් පෙති ඉවත නොළා"
(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.
(ආ) තුන්වන පද්‍ය පදයේ අර්ථය ලියන්න

VII. (අ) "පාලිධම්ම පදට්ඨ කතාව" ඇසුරින් සකස් කළ ග්‍රන්ථය කුමක්ද?
(ආ) පාලි ජාතකට්ඨ කතාව ඇසුරින් සකස් කළ ග්‍රන්ථය ලියන්න

VIII. පහත සඳහන් ග්‍රන්ථවල කතුවරුන් නම් කරන්න
(අ) සාහිත්‍ය විද්‍යාව
(ආ) නන්දන ගීත

IX. (අ) ජනකවිය අනුරාධපුර යුගය දක්වා දිගු ඉතිහාසයකට නෑකම් කියන බව පැවසෙන්නේ කුමන ග්‍රන්ථයකට අනුවද?
(ආ) "මේ වැදීම් මාන තොප අතින් අද ඇසීම්" හෝ "මේ වැදීම් මාන" යනුවෙන් අදහස් කළේ කුමක්ද?

X. (අ) සෑම කතා වස්තුවක්ම ඉදිරිපත් කිරීමට ප්‍රථම එම කථාව දැක්වීමට හේතුව ප්‍රකාශ කරන ග්‍රන්ථය කුමක්ද?
(ආ) 5 වන කාශ්‍යප රජතුමා රචනා කල දැනට හමුවී ඇති පැරණිම කෘතිය කුමක්ද?

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

I. "නගන ලද දළ පුඩු සේසත් ඇති එක් සියයක් රාජාසන ආදී වූ පිළියෙල කොට තබන ලද **<u>ශ්‍රී විභූතීන්</u>** දැක මහ බෝසතාණන් වහන්සේ විසින් වදාරන ලද ක්‍රමයෙන්ම සියල්ල කොට සේනා මධ්‍යයට වැද බොහෝ දෙන **<u>ක්ෂෝභ</u>** කොට තමන්ගේ මියුලු නුවරට පලා ගියහ"

(අ) මේ පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න

(ආ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න

II. "මැ දන්නා ශිල්පත් උගත් හෙයින් මුත් **<u>සයංසිද්ධ</u>** නොවන්නේ වේද? ඇගේ එ **<u>බැවුම්</u>** පලවා මමත් ශිල්ප උගනිමි"

(අ) මෙස් සිතීමට මුල්වූ අවස්ථාව කෙටියෙන් ලියන්න

(ආ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න

III. " යොදා සවන් වෙණ නද රස් සුලබව
නදා එකහ සික් වන නොම සකොබව
සදා කුලය නොහැරම එන අසුබව
ඒදා ගියේ රිලවුන් සන්සල බව

(අ) වීනා නාදය ඇසීම නිසා මෙහි කියැවෙන සත්ත්ව වර්ගයාට සිදුවූයේ කුමක්ද?

(ආ) ඔවුන්ගේ පරම්පරා පුරුදු මොනවාද?

IV. "මුවපත් වුයේ - නියත විනාසේ
මේ මොහොතේ කිම් කරන්නෙමි දෝ
මුළා වී මග නොපෙනේ"

(අ) ඉහත ප්‍රකාශ කරන අයගේ චරිතයේ විශේෂ ලක්ෂණ ලියන්න

(ආ) ප්‍රකාශය කළ අය අනතුරුව කුමක් කළේද?

V. "අඩල වැඩක් නෑ ළමයා. මං දැන් හොඳටම වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ."

(අ) මේ සිද්ධියට පදනම් වූ අවස්ථාව කෙටියෙන් ලියන්න

(ආ) ඔහු හොඳින් දන්නා බවට ඉදිරිපත් කරන සාධකය කුමක්ද?

3. (I ) කාය ශක්තිය පරදා බුද්ධිමය හැකියාවේ ප්‍රබලත්වය කියාපෑම
(II) ඒ සඳහා අවස්ථා හා සිද්ධි යොදාගෙන තිබීම
උම්මග්ග ජාතකයේ එන සතරකන් මන්ත්‍රණය පාඩමෙන් සිත්ගන්නා අයුරින් ඉදිරිපත් කොට ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න

නැතහොත්

(I) කුඩා කළදීම දරුවන් ගුණ දහමින් පෝෂණය කිරීම
(II) ඒ සඳහා විවිධ කාව්‍ය, උපක්‍රම යොදා ගැනීම "මුණිසිරිපා සිඹිමින්නේ" කාව්‍ය පන්තියෙන් රසවත්ව කියා ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

4. I "සාමානයෙන් පැරණි ගමකට වඩා බැද්දේගම වෙනස් ගමක්" බවද
II ඒ සඳහා භාෂාව භාවිත කොට ඇති ආකාරය ද උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

"ගංගාවේ සංගීතය" පද්‍ය පන්තියෙන්

I. ස්වභාව ධර්මය ආශ්‍රයෙන් සහෘදයා තුළ සංකල්ප රූප මැවීමේ දක්ෂතාව
II. ගඟ ජීවිතයට සම්බන්ධ කරමින් ඉදිරිපත් කරන ජීවන දර්ශනය

උදාහරණ දෙක බැගින්වත් දෙමින් විස්තර කරන්න.

5. ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස චරිත වෙනස් කිරීමට කතුවරයා තුළ වූ ප්‍රතිභාව "ගුත්තිල කාව්‍ය" වඩාත් රසවත් වීමට හේතු වී ඇත. උදාහරණ දෙක බැගින්වත් දෙමින් පැහැදිලි කරන්න.

6. ජන කවියේ ඇති සුවිශේෂ ලක්ෂණය උපදෙස් කවි තුළද දැකිය හැකිය. උදාහරණ දෙකක්වත් දෙමින් විස්තර කරන්න.

7. ගුරුළුගෝමී පඬිවරයා අමාවතුරේ භාවිතකොට ඇති භාෂා ශෛලිය පිළිබඳව විස්තරයක් අදාළ පාඩම ඇසුරින් නිදසුන් දෙකක්වත් දෙමින් විමසීමක් කරන්න.